පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම : කම්කරු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

நிறுவனத்தின் பெயர் : தொழில் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முவைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிறகுப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

Parliamentary Series No: 79

Name of the institution: Labour Department

Submission of observation of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of standing Order No. 119(4)

ආකෘතිය (අංක. 01)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලාවේ අංකය : ප්‍රකාශනමාලා අංක 79

ආයතනයේ නම : කම්කරු දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 91.00	
අවධානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/AMC/02/2021/02 හා 2021.04.05 දිනැති ලිපිය අනුවද, DMA/01-2019(1) චක්‍රලේඛයෙහි විධිවිධාන අනුවද 2022 වර්ශයේ සිට අවධානම් ලේඛනය සකස් කිරීම ආරම්භ කර ඇති අතර කාලීනව සිදු වන වෙනස්කම් අනුව එය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. තවද 2024.06.21 දිනැතිව නිකුත් කරන ලද කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/1-2024හි 06 ඡේදයේ සඳහන් පරිදි 2025 වර්ෂයේ සිට සෑම ආයතනයක් තුලම අවධානම් කළමනාකරණ රාමුවක් සකස් කල යුතු අතර අවධානම් හඳුනාගැනීමේ කටයුතු සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් වර්ධනය කිරීමට කටයුතු කල යුතුය. ඒ අනුව කමිටුවක් පත් කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ.
සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	වාහනවල රාජ්‍ය ලාංඡනය හා දෙපාර්තමේන්තු නාමය පින්තාරු කිරීමේ කටයුතු රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙතින් සිදු කර ගැනීමට කටයුතු කර ඇති අතර අදාල කාර්යය සිදු කිරීම සඳහා දිනකට අවම වශයෙන් වාහන 8ක් වත් එවීමට කටයුතු කරන ලෙස එම දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. දෙපාර්තමේන්තුව සතු වාහන දිවයින පුරා විසිරී ඇති ප්‍රාදේශීය කාර්යාලවල රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර ඇති බැවින් සහ ප්‍රධාන කාර්යාලයේ වාහන දිනපතා උසාවි රාජකාරී වැනි අත්‍යාවශ්‍ය හා හදිසි රාජකාරී සඳහා යෙදවිය යුතු බැවින් දිනකට අවම වශයෙන් වාහන 8ක් රජයේ කර්මාන්ත ශාලාව වෙත යොමු කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් පින්තාරු කිරීමේ කටයුතු අවසන් කර නැත. කෙසේ නමුත් 2024.09.30 දින වන විට සියළු වාහනවල දෙපාර්තමේන්තු නාමය සහ රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.
මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන්උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සිමාව ඉක්මවන පරිදි බැරකම්වලට එලඹ තිබුණි.	2022 වර්ෂයේදී, 221-1-1-1202, 221-2-4-1-1302 හා 221-2-4-1-1402 යන පුනරාවර්තන වැය විෂයන් 3 සඳහා පමණක් වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සිමාවඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි. ඒ සඳහා පහත හේතූන් බලපා ඇත. කම්කරු දෙපාර්තමේන්තුවේ මුළු අංශ 101කින් සමන්විත වේ. මෙම සියලුම අංශ වෙතින් බැරකම් ලෙස හඳුනා ගෙන වාර්තා කිරීමේදී ප්‍රායෝගික

	අපහසුතා රාශියක් පැන නැගී ඇත. බැරකම් වාර්තා කරන පාර්ශවයන් නිවැරදිව බැරකම් හඳුනා නොගැනීම, වාර්තා නොකිරීම, වාර්තා කලද නිවැරදි වටිනාකම හඳුනා නොගැනීම, වාර්තා කලද ගෙවීමට ඉදිරිපත් නොවීම වැනි හේතූන් මත බැරකම් වාර්තා කිරීම හා ගෙවීමට ඉදිරිපත් වීම අතර වෙනස්කම් ඇති වී ඇත. කෙසේ වෙතත් නිවැරදි බැරකම් හඳුනා ගෙන වාර්තා කිරීමට සියලු පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර බැරකම් නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම 2023 වර්ෂයේදී අධිවැය ඇති නොවන පරිදි බැරකම්වලට ඵලඹ තිබුණු අතර එය විගණන අධිකාරිගේ අංක LSW/B/LD/02/2022/AQ10 හා 2024.07.09 දිනැති විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවෙන් තහවුරු කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	1. 2021 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් ඇති, සේවයෙන් පහ කල හා සේවය අවසන් කල නිලධාරීන්ගෙන් අය විය යුතු ශේෂ, • වර්ෂ 2 ත් 4 ත් අතර : රු. 781,108.00 • වර්ෂ 5 ට වඩා වැඩි : රු. 1,186,675.00 • එකතුව : රු. 1,967,784.16

ණය ශේෂ අය කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග	නිළධාරීන් ගණන	**2021.12.31** දිනට ශේෂය	**2024**.07.29 දිනට අයකරගත්/ කපා හරින ලද ශේෂය	අය කර ගැනීමට ඇති ශේෂය
අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය යටතේ කපා හැරීම	14	196,494.25	196,494.25	-
නඩු පැවරීමට යවා ඇති	8	722,539.96	38,840.21	683,699.75
වාරික වශයෙන් ගෙවීම	5	349,905.00	116,133.00	233,772.00
ඇපකරුගෙන් අයවීම්	1	99,470.45	58,130.58	41,339.87
ගෙවා අවසන්	1	52,248.00	52,248.00	-
මිය ගිය,ලිපි සඳහා ප්‍රතිචාර නොදක්වන,ලිපිනයන් තහවුරු කර ගත නොහැකි	13	547,126.50		547,126.50
එකතුව	42	**1,967,784.16**	**461,846.04**	**1,505,938.12**

	2. ඉහත සඳහන් අය කර ගැනීමට ඇති මුළු ණය ශේෂය වන රු. 1,967,784.16 න් රු.461,846.04 ක් මේ වන විට අය කර ගෙන ඇති අතර, ඉතිරි ණය ශේෂයන් අය කර ගැනීමට, • රු. 683,699.75 ක ණය ශේෂ 8 ක් අය කර ගැනීම සඳහා නඩු පැවරීම සඳහා නීති ක්‍රියා අංශය වෙත යවා ඇත. • රු. 233,772.00 ක ණය ශේෂ 5 ක් එම නිළධාරීන් විසින් වාරික වශයෙන් ගෙවීම් කරනු ලබයි. • රු. 41,339.87 ක ණය ශේෂයක් ඇපකරුගෙන් අයවෙමින් පවතී. • රු. 547,126.50 ක ණය ශේෂ 13 ක් අය කර ගැනීමට අදාළ නිළධාරීන් වෙතත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතත් ලිපි මගින් ණය ශේෂ ගෙවන ලෙස දැනුවත් කර ඇත. 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 (4) අන්තර්කාලීන විධිවිධාන යටතේ දිගු කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ රු.100,000 ක් දක්වා කපා හැරීමට ප්‍රධාන ගණුන් දීමේ නිලධාරියා වෙත බලය පවරා ඇති බැවින් 2024.12.31 දිනට පෙර මෙම ණය ශේෂයන්ගෙන් අය කර ගත නොහැකි ණය ශේෂ කපා හැරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව ඉහත සඳහන් අය කර ගැනීමට ඇති මුළු ණය ශේෂය වන රු. 1,967,784.16 න් රු.457,854.90 ක් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 (4) යටතේ කපා හැරීමට හඳුනා ගෙන ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	එකී වසර දෙක ඉක්මවූ තැන්පතු පිළිබඳව මු. රෙ. 571 අනුව කටයුතු කිරීමට හැකි සෑම විටම උත්සහ කරන අතර සේවක අර්ථසාධක අරමුදල් තැන්පතු විවිධ ආකාරයෙන් නඩු මගින් අයකර ගන්නා වාරික වශයෙන් එකතුවන මුදල් ඇතුලත්ව ඇති අතර සම්පූර්ණ මුදල එකතුවන තෙක් ගෙවීම් කිරීමට නොහැකි වීම, තැන්පත් මුදල් හිමියන් විදේශ ගත වීම, මුදල් හිමිකරුවන් මියයාම හේතුවෙන් උරුමක්කරුවන් ඉදිරිපත් වන තෙක් සිටීම වැනි හේතු නිසා මෙම මුදල් ගෙවීම ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත් මෙලෙස ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් නොයෙකුත් අවස්ථාවන්හිදී රජයේ ආදායමට බැර කරන ලද මුදල් නැවත ආදායමෙන් ආපසු ගෙවීම් ලෙස ගෙන්වාගෙන ගෙවීමට සිදුවී ඇත. එලෙස ආපසු ගෙන්වා ගැනීමේදී ප්‍රමාදවීම් ඇතිවීම සිදුවන නිසා අදාළ හිමිකරුවන්ට නොයෙකුත් අපහසුතා වලට ලක්වීමට සිදු වී ඇති බැවින් මෙම මුදල් රජයේ ආදායටම බැර කිරීම ප්‍රමාද කර ඇත. වර්ථමානයෙදී සියළුම අංශ හා ප්‍රාදේශීය කාර්යාල වෙතින් විමසා ගෙවීම් ප්‍රමාද වන තැන්පතු ඉදිරි මාස 05 තුල නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. කොළඹ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණ මගින් සේවක අර්ථසාධක අරමුදල් අයකිරීම් අංශය හරහා පොදු තැන්පත් ගිණුම වෙත ලැබෙන අයකිරීම් නිරවුල් කිරීම වෙනුවෙන් ස්ථාවර කමිටුවක් පත් කර වර්ෂ 02 ට වැඩි ශේෂය නිරවුල් කිරීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයන් මේ වන විටත් සකස් කරමින් පවතී.

	සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන් නිරවුල් කිරීම සඳහා අයකිරීම් අංශය සමග සම්බන්ධ වී කොළඹ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණ මගින් සේවක අර්ථසාධක අරමුදල් අයකිරීම් අංශය වෙත දැනට ලැබෙන චෙක්පත් ඉදිරියේදී අදාළ දිස්ත්‍රික් කාර්යාල වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එමගින් ඉදිරියේදී පොදු තැන්පත් ගිණුමේ ශේෂයන් හඳුනා ගැනීමේ ගැටළු ඇති නොවීමට හේතු වේ. සේවක අර්ථසාධක අරමුදල් නොවන ශේෂය නිරවුල් කිරීමේදී (භිග වැටුප්, පාරිතෝෂික, වන්දි, දීමනා, ණය පරික්ෂණ ගාස්තු, වෙනත්) ලිපිනයන් සොයා ගත අපහසු සේවකයින් සම්බන්ධයෙන් සේවය අවසන් කිරීමේ අංශය මගින් පුවත්පත් දැන්වීම් පළ කිරීමට සූදානම් කර ඇති අතර, එය පළ කිරීමෙන් පසුද සේවකයින් නොපැමිණෙන්නේනම් අදාළ වන්දි මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීම සුදුසු වේ. එම කාර්යය සඳහා මාස 04 පමණ කාලයක් අවශ්‍ය බවද වැඩි දුරටත් කාරුණිකව දැනුම් දෙමි. එමෙන්ම මෙම තත්වය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන මෙය නිවැරදි කිරීම සඳහා 2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ද ඇතුළත් කොට කටයුතු කරනු ලැබේ.
දෙවැනි කොටස : 82.00	
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යයසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2022 වර්ෂය සඳහා 2018.01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගෙන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණ නමුත් ඒ සඳහා අවශ්‍ය මූලික පියවර ගෙන තිබුණි. කම්කරු දෙපාර්තමේන්තුවේ තනතුරු 70ක් සඳහා 2593ක කාර්ය මණ්ඩලයක් 2021.12.31 දිනට ප්‍රධාන කාර්යාලයේ අංශවල සහ දීප ව්‍යාප්තව පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාලවල සේවයේ නියුතුව සිටි අතර එම නිලධාරීන් සියලු දෙනා සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම සංකීර්ණ කාර්යයක් බැවින් එය සිදු කරන ආකාරය පිළිබඳව 2022 වර්ෂයේ දී අධ්‍යයනය කරමින් පැවතිණි. ඒ අනුව, එම කටයුතු අවසන් වන තෙක් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්යසාධන ඇගයුම් සිදු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා 1998/03/13, 1998/04/30 සහ 1998/12/11 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98(i) හා 08/98(ii) මගින් හඳුන්වා දී ඇති කාර්ය සාධන ඇගයුම් ආකෘති පදනම් කර ගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ඇගයුම් සිදු කිරීමට කටයුතු කරන ලදී. එබැවින්, 2022 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්යසාධන ඇගයුම් සිදු කිරීමේ කටයුතු අඛණ්ඩව සහ අර්ථපූර්ණව සිදු කර ඇති බව වැඩි දුරටත් කාරුණිකව සඳහන් කරමි.

	එසේම, උක්ත සඳහන් 02/2018 දරණ චක්‍රලේඛයට අතිරේකව නිකුත් කරන ලද 2023/11/30 දිනැති "රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම" සම්බන්ධ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(1) හි තුන්වන ඡේදයේ සඳහන් කරුණු කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි. එම චක්‍රලේඛය අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි (1) ඡේදය සංශෝධනය කරනු ලබන බවත් ඒ අනුව එම චක්‍රලේඛයේ සඳහන් පරිදි කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවන බවත් දැනුම් දී ඇත. එසේම, එම චක්‍රලේඛය මගින් රාජ්‍ය සේවයේ සියලුම මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයුම් සම්බන්ධව උක්ත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98(i) හා 08/98(ii) මගින් හඳුන්වා දී ඇති කාර්ය සාධන ඇගයීම් ආකෘති තව දුරටත් භාවිතා කිරීම අනුමත කර ඇති බව ද කාරුණිකව සඳහන් කරමි. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයුම් කිරීම සඳහා පරිපාලන චක්‍රලේඛ 02/2018(1) පරිදි කාර්ය සාධන ඇගයීම් ආකෘති තව දුරටත් භාවිතා කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව කාරුණිකව සඳහන් කරමි.
සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 සහ 2022 දෙවර්ෂයන් සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්මෙහි ජ්‍යෙෂ්ඨ මට්ටම, තෘතීය මට්ටම, ද්විතීය මට්ටම සහ ප්‍රාථමික මට්ටම යන සියලු නිලධාරි කාණ්ඩයන්ට අයත් නිලධාරීන් ආවරණය වන පරිදි වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථා සැලසෙන පරිදි මූලික පුහුණු සැලසුම සකස් කර අන්තර්ගත කර තිබුණි. ඒ අනුව, එම මූලික සැලැස්ම පදනම් කරගෙන සහ 2022 වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳවද අවධානය යොමු කරමින් 2022 වර්ෂය සඳහා වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කර ඉහත නිලධාරී කාණ්ඩයන්ට අදාළ නිලධාරීන්ගෙන් 70%ක් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කර පැවැත්වීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2021 සහ 2022 දෙවර්ෂයන් සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම මගින් මූලිකව සැලසුම් කර තිබූ පුහුණු අවස්ථා වලින් 2022 වර්ෂයේ දී ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය ඉහත ප්‍රකාශය පරිදි 50%කට වඩා අඩු මට්ටමක නොපැවති බවත් එය70%ක මට්ටමක පැවති බවට නිවැරදි විය යුතු බවත් කාරුණිකව සඳහන් කරමි. එසේම, 2023 සහ 2024 දෙවර්ෂයන් සඳහා ද ජ්‍යෙෂ්ඨ මට්ටම, තෘතීය මට්ටම, ද්විතීය මට්ටම සහ ප්‍රාථමික මට්ටම යන සියලු නිලධාරි කාණ්ඩයන්ට අයත් නිලධාරීන් ආවරණය වන පරිදි වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථා සැලසෙන පරිදි කම්කරු දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර මූලික පුහුණු සැලසුම ද එහි අන්තර්ගත කරන ලදී. එසේම, එම මූලික සැලැස්ම පදනම් කරගෙන සහ වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳවද අවධානය යොමු කරමින් 2023 වර්ෂය සහ 2024 වර්ෂය සඳහා වෙන් වශයෙන් වාර්ෂික පුහුණුසැලසුම් සකස් කර ඉහත නිලධාරී කාණ්ඩයන්ට අදාළ නිලධාරීන්ගෙන්

	50%කට වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කරන ලද බවද වැඩි දුරටත් කාරුණිකව සඳහන් කරමි. මෙම කටයුතු කලින් කලට යාවත්කාලීන වන චක්‍රලේඛ, උපදෙස් ආදිය පරිදි ඉදිරි වර්ෂයන්හිදී ද අඛණ්ඩව සිදු කිරීම සඳහා වගකීම නිශ්චිත නිලධාරීන් වෙත පවරා ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බවද කාරුණිකව සඳහන් කරමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	මෙම දෙපාර්තමේන්තුව සඳහා ලැබී ඇත්තේ යටත්ව විගණන මතයක් බැවින් එම විගණන කරුණු වලින් වන බලපෑම හැර ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ බව විගණනයෙන් තහවුරු කර ඇත. ඒ ඒ වසර වල යටත්ව මතය ලබා ගැනීමට වූ විගණන නිරීක්ෂණ අනුව කළ හැකි නිවැරදි කිරීම් අඛණ්ඩව සිදු කර ඇති බැවින් ඉදිරියේදී ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනවල එවැනි තත්ත්ව ඇති නොවීමට කටයුතු කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය